**අලව්ව ප්‍රාදේශීය සභාව.**
**කුරුණෑගල දිස්ත්‍රික්කය.**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 11 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**----------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට අලව්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | -------------------------------- | ------------------------ | ---------------------------- |
| (අ) | හඟවත්ත හුරියගොල්ල සුසාන භූමියේ ඉඩමෙහි හා මාබෝපිටිය මීගහමුල කුඹුර ඉඩමෙහි වටිනාකම තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි. | අදාළ වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුවේ. | වටිනාකම් තක්සේරු කර නොමැති ඉඩම් 02 හි වටිනාකම තක්සේරු කර ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි. |
| (ආ) | රු. 103,995 ක් වටිනා පරිගණක උපාංග 10 ක් ගිණුම් ගත කර නොතිබුණි. | පරිගණක උපාංග ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | ගිණුම ගත නොවී ඇති පරිගණක උපාංග 10 හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 07 කට අදාල ශේෂයන් හා ඊට අදාල උපලේඛනවල පැවති ශේෂයන් අතර රු.1,922,523 ක වෙනසක් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීම් කළ යුතුවේ. | රථවාහන වල සිදුව ඇති වෙනස්කම් මෙම වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ දී සටහන් කිරීමට කටයුතු කරන බව දන්වා සිටින අතර අනෙකුත් වෙනස්කම් වලට හේතු සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රු.15,389,078 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් සඳහා අදාල ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛන, උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණය මෙම වසරේ සිට ආරම්භ කරන බවත්, විගණනය විසින් පෙන්වා දී ඇති ආකාරයට මෙම වර්ෂයේ සිට යන්ත්‍ර සූත්‍ර හා ලී බඩු සවිකිරීම් වෙනුවෙන් වෙන වෙනම ලේඛන පවත්වා ගෙන යාමට කටයුතු කරන බව දන්වමි. |

**1.4 අනුකූල නොවීම්**

**------------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

**-------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ක කාලය ඉක්මවූ රු.733,692 ක තැන්පත් 134 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | වසර 02 කට වැඩි තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2015, 2016 වර්ෂ වලට අදාලව ලබා නොගත් තැන්පත් 50කට අදාලව රු. 76029.96 ක මුදලක් 2019.01.30 දින මුදල් කමිටු තීරණ 4.III මගින් ආදායමට ගැනීමට කටයුතු කර තිබුණි. |

**02. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 15,309,488 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 18,599,699 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

### 2.2.2 බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු

| ආදායම් ප්‍රභවය | | 2018 වර්ෂය | | | | 2017 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| I. | වරිපනම් හා බදු | 3,502 | 2,894 | 3,447 | 366 | 2,946 | 3,461 | 3,744 | 920 |
| II. | බදු කුලී | 11,530 | 9,899 | 10,003 | 83 | 10,996 | 9,794 | 9,655 | 190 |
| III. | බලපත්‍ර ගාස්තු | 1,928 | 2,061 | 2,093 | - | 1,502 | 1,917 | 1,963 | - |
| IV. | වෙනත් ආදායම් | 90,871 | 74,343 | 63,409 | 41,297 | 71,131 | 66,507 | 71,975 | 17,631 |
| එකතුව | | 107,831 | 89,197 | 78,952 | 41,746 | 86,575 | 81,679 | 87,337 | 18,741 |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අලව්ව ප්‍රාදේශිය සභා බලප්‍රදේශය තුළ ස්ථාපිත කර ඇති දුරකථන සංඥා කුළුණු 12 න් කුළුණු 10 ක් සඳහා 2018 වර්ෂය වෙනුවෙන් ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2018 වර්ෂය සඳහා ව්‍යාපාර බදු ගෙවන ලෙස සියලුම දුරකථන සමාගම් වලට ලිපි යොමු කර ඇත. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

**කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ රුපියල් මිලියන 05 ක ප්‍රතිපාදන මත සිදු කරමින් පැවති ජල ව්‍යාපෘතියේ වාර්තාව අනුව ප්‍රධාන ක්‍රියාකාරකම් 06 ක් වූ අතර ඉන් පළමු ක්‍රියාකාරකම වූ ළිඳ සකස් කිරීම සඳහා රු. 1,696,320 ක් වූ ගිවිසුම් ගත වටිනාකම මත 2018 ඔක්තෝබර් 11 දින ආරම්භ කර මාස 02 දින 14 ක් ඇතුළත ඉදිකිරීම් කළ යුතු වුවද ව්‍යාපෘතියට අදාළ අනෙකුත් ක්‍රියාකාරකම් 2019 ජනවාරි 23 දින වන විටත් නිමකර ව්‍යාපෘතියේ අරමුණු වූ පවුල් 125කට පානීය ජලය ලබා දීමට කටයුතු කර නොතිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ මහජනතාවට ලබා දීමට කටයුතු කළ යුතුවේ. | මාරගල්කන්ද ජල යෝජනා ක්‍රමය සඳහා ප්‍රධාන අමාත්‍යාංශ ප්‍රතිපාදන මත බෙදා හරින ප්‍රධාන ටැංකි දක්වා ඉදි කරන ළිදෙන් ජලය ගෙන ඒම පලමු අදියර ලෙස ක්‍රියා කළ යුතු විය. එමෙන්ම ජනතාවගේ නිවෙස් දක්වා අවශ්‍ය ජලය බෙදා හැරීමට මාරගල්කන්ද ජල ව්‍යාපෘතිය තුලින් ප්‍රතිපාදන වෙන් කර නොතිබූ නිසා දෙවන අදියර යටතේ 2019 වර්ෂයේ මේ සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇති බව දන්වමි. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේදී බැකෝ ලෝඩරය සහ මෝටර් ග්‍රේඩරය සඳහා රු. 771,615 ක් වියදම් කර තිබුණද, කුමන කටයුතු සඳහා යෙදවූයේද යන්න තහවුරු කර ගැනිමට ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ලේඛනගත තොරතුරු පවත්වා ගැනීමට කටයුතු කළ යුතුවේ. | රියදුරු මහතුන්ගේ කල වැඩ සටහන් ගොනු වල සංවර්ධනය හා නඩත්තු කරන මාර්ග හා කාණු පිළිබඳ විස්තර ලද ප්‍රදේශ , වැය කරන ලද පැය ගණන සටහන් කර ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වසරක් ඉක්මවා තිබූ රු.1,528,569 ක ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර රු.8,027,743 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂය කොපමණ කාලයක සිට පවතින්නේද යන්න හඳුනාගෙන නොතිබුණි. | වසරක් ඉක්මවා තිබුණු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු අතර රු. 8,027,743 ක නිශ්චිතව හඳුනාගත නොහැකි ණය ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ගෙවිය යුතු ශේෂ හඳුනාගෙන නිරවුල් කරන බව දන්වමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**(අ) සේවක පුරප්පාඩු සහ අතිරික්ත**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු 13 ක් පැවතුණු අතර පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කර තිබූ සංවර්ධන නිලධාරීන් 15 දෙනෙකු අතිරික්තව පැවතුණි. ප්‍රාථමික අංශයේ තනතුරු 5 කට අදාළව පුරප්පාඩු 8 ක් පැවති අතර තනතුරු 3 කට අදාළව අතිරික්ත 5 ක් පැවතුණි. තවද තනතුරු 3 කට අදාළ අනියම් සේවකයින් 10 දෙනෙක් බඳවා ගෙන තිබුණි. | පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීමට හා අතිරික්ත සේවකයින් විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ද්විතියික අංශයේ තනතුරු 07 කට අදාල පුරප්පාඩු 13 ක් පැවතුණු අතර අතිරික්ත නිලධාරීන් 15 ක් වන්නේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරීන්ය. එසේම ප්‍රාථමික අංශයේ තනතුරු 5 කට අදාලව පුරප්පාඩු 8 ක් පැවතුනි. |

**(ආ) සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මියයාම සහ තොරතුරු සොයාගත නොහැකි වීම මත මාසිකව අය නොවන සේවක ණය මුදල රු. 62,753 ක් විය. | අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ආර්.පී. කරුණාරත්න මයා මියගොස් ඇති අතර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත තොරතුරු යවා ඇති නමුත් තවම අදාල මුදල අයකර එවීමට කටයුතු කර නොමැති බව දන්වමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 නිශ්කාර්ය වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අලව්ව බස් නැවතුම්පල වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 28 න් කාමර 12 ක් බදු දීමට නොහැකිව නිශ්කාර්යව පැවතුණි | බදු දීමට කටයුතු කළ යුතුවේ. | මෙම කඩ කාමර ලබාගැනිමට පැමිණෙන බදුකරුවන් පවසන්නේ මෙම කඩ කාමර සඳහා එකවිට ගෙවිමට ඇති රු.1,120,000 මුදල ගෙවිමට අපහසු බවය. එබැවින් එකවිට ගෙවන මුදල අඩුකර ගැනිම සඳහා මහ සභාවට යොමු කල අතර 2018.11.19 දින පැවති මහ සභා තීරණ අංක 3.12 යටතේ ලංසු 5 දක්වා අඩුකර ටෙන්ඩර් කිරිමට අනුමැතිය ලැබී ඇති බව දන්වමි. |

**3.5 ප්‍රසම්පාදන**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2018 වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබු අතර 2019 වසර සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇත. |